# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2093/42 – 2018 ඔක්තෝබර් 20 වැනි සෙනසුරාදා – 2018.10.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, වැඩබලන ඉඩම් අමාත්‍ය, විජේසුන්දර මුදියන්සේලාගේ තිලකරත්න බණ්ඩාර ඒකනායක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුව සුළු කොට්ඨාසයේ, උඩුගම ගමේ පිහිටි, ගම්පහ දිස්ත්‍රික් භාර මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ගම්/මීරි/2016/297 හා 2016.10.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – කදුරුගහලන්ද – ප්‍රමාණය: හෙක්. 0.1334

උතුරට: කේ. එස්. ධර්මවති පීරිස් හිමිකම් කියන කදුරුගහලන්ද සහ ලංකා විදුලිබල මණ්ඩලය හිමිකම් කියන කදුරුගහලන්ද හෙවත් පරගහකන්ද; නැගෙනහිරට: ලංකා විදුලිබල මණ්ඩලය හිමිකම් කියන කදුරුගහලන්ද හෙවත් පරගහකන්ද සහ කේ. එස්. ධර්මවති පීරිස් හිමිකම් කියන කදුරුගහලන්ද; දකුණට සහ බටහිරට: කේ. එස්. ධර්මවති පීරිස් හිමිකම් කියන කදුරුගහලන්ද.

ටී. බී. ඒකනායක,
ඉඩම් අමාත්‍ය (වැ.බ.).

යොමු අංකය: 4-3/2/2016/සීර්බී/24.
2017 අප්‍රේල් මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
අංක 1200/6, ''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 265

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔගල උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, වැලිවරණාගොල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ඒ/එල්ජීජී/2014/359 හා 2015.03.04 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වැලිවරණාගොල්ල – ප්‍රමාණය: හෙක්. 0.2521ක් පමණ**

උතුරට: මහවැලි අධිකාරිය හිමිකම් කියන වැලිවරණාගොල්ල ඉඩම; නැගෙනහිරට: මාර්ගය; දකුණට: එල්. චමින්ද ජයසූරිය හිමිකම් කියන වැලිවරණාගොල්ල ඉඩම සහ කේ. එම්. ජේම්ස් අප්පුහාමි හිමිකම් කියන වැලිවරණාගොල්ල ඉඩම; බටහිරට: මහවැලි අධිකාරිය හිමිකම් කියන වැලිවරණාගොල්ල ඉඩම.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2009/එම්වී/135ඒ.
2018 අගෝස්තු මස 27 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
අංක 1200/6, ''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 266

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.